# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2277/68 – 2022 අප්‍රේල් 30 වැනි සෙනසුරාදා – 2022.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, තවාළුවිල (අ.ග.පි. 466) ගමේ සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක HA/AMB/2020/126 හා 2020.10.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අක්ෂර 'A' – සදන්පාක් – ප්‍රමාණය: හෙක්. 0.0212**
උතුරට: කේ. එම්. මල්ලිකා හිමිකම් කියන සදන්පාක් සහ මාර්ගය; නැගෙනහිරට: වලවේ ගඟ; දකුණට: වලවේ ගඟ සහ කැබලි අක්ෂර බී; බටහිරට: කේ. එම්. මල්ලිකා හිමිකම් කියන සදන්පාක් සහ මාර්ගය.

02. **කැබලි අක්ෂර 'B' – සදන්පාක් – ප්‍රමාණය: හෙක්. 0.0061**
උතුරට: කේ. එම්. කමලාවතී හිමිකම් කියන සදන්පාක්, කේ. එම්. මල්ලිකා හිමිකම් කියන සදන්පාක් සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: වලවේ ගඟ; දකුණට: වලවේ ගඟ සහ කැබලි අක්ෂර සී; බටහිරට: කේ. එම්. කමලාවතී හිමිකම් කියන සදන්පාක්, කේ. එම්. මල්ලිකා හිමිකම් කියන සදන්පාක් සහ කැබලි අක්ෂර A.

03. **කැබලි අක්ෂර 'C' – සදන්පාක් – ප්‍රමාණය: හෙක්. 0.0031**
උතුරට: කේ. ශාමිලා ශ්‍රීවන්ති හිමිකම් කියන සදන්පාක්, කේ. එම්. කමලාවතී හිමිකම් කියන සදන්පාක් සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: වලවේ ගඟ; දකුණට: ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හිමිකම් කියන සමාගම්වත්ත; බටහිරට: ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හිමිකම් කියන සමාගම්වත්ත සහ කේ. ශාමිලා ශ්‍රීවන්ති හිමිකම් කියන සදන්පාක්.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2019/WS/518.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 - 0227